# කොරියානු භාෂා පරීක්ෂණය වෙනුවෙන් ලියාපදිංචි කිරීම -2025

## ( නිෂ්පාදන සහ ධීවර ක්ෂේත්‍ර )

## අයදුම්කරුවන් සඳහා උපදෙස්

**විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමය ( Online ) ඔස්සේ 2025.09.15 සිට 2025.09.17 දින දක්වා පමණක් සිදු කරනු ලැබේ.**

**විභාග අයදුම්පතක් ලබාගැනීමට ඔබ සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම්:-**

1. වයස අවුරුදු 18-39 ත් අතර අයෙකු වීම. ( 1985 සැප්තැම්බර් 15 සිට 2007 සැප්තැම්බර් 14 දක්වා උපන් අයෙකුවීම )
2. උසාවියකින් නඩු නිමිත්තක වරදකරුවෙකු වී දඩ මුදල් ගෙවීමක්,සිරදඬුවම් හෝ බරපතල දඬුවම් නොලැබුණු අයෙකු විය යුතුය.
3. කොරියානු ජනරජයෙන් ආපසු හරවා හෝ නෙරපා එවු අයෙකු නොවිය යුතුය.
4. මෙරටින් බැහැරවීම් තහනම් කර ඇති අයෙකු නොවිය යුතුය.
5. වර්ණ අන්ධ හෝ වර්ණ දුර්වලකම් නොමැති අයෙකු විය යුතුය.
6. කොඳුඇට පෙළ ආබාධ සහිත හෝ ඇඟිලි අඩු හෝ ඉවත් කර ඇති අයෙකු නොවිය යුතුය.(එවැනි අබාධ සහිත පුද්ගලයින්ට විභාගයට පෙනී සිටීමට අවස්ථාව හිමිවන නමුත්, ඔවුන් විභාගය සමත් නොකරනු ඇත.)
7. **E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර පහකට ( 05 ) වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති අයෙකු විය යුතු ය.**


**විභාග අයදුම්පතක් ලබාගැනීමට අවශ්‍ය දෑ:-**

විභාග අයදුම්පත් නිකුත් කිරීම අන්තර්ජාලය ඔස්සේ මාර්ගගතව (online) සිදුකරන බැවින්, ලියාපදිංචි වීමට පෙර පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඔබ සතුව තබා ගැනීමට කටයුතු සිදුකරන්න.

1. **ඉදිරියට අවම මාස 03ක කාලයක් සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය සහිත පිටුවෙහි ස්කෑන් කරන ලද JPG ඡායාරූපයක් (1MB) විය යුතුය. ( නමුත් විභාගයට පෙනී සිටින විට ඔබ සතුව වලංගු ගමන් බලපත්‍රයක් තිබිය යුතුය.)**

2. මාස 03ක් ඇතුළත ලබාගත් **3.5 cm x 4.5 cm** ප්‍රමාණයේ **සුදු පැහැති** පසුබිම සහිත පැහැදිලි ස්කෑන් කරන ලද වර්ණ ඡායාරූපයක් **JPG විය යුතුය**. ( **සුදු පැහැති** ඇඳුමකින් සැරසී ඡායාරූපය ගැනීමෙන් **වැළකී සිටිය** යුතුය)

   - Photo width : 100 -300 pixels
   - File type : Only JPG
   - File Capacity : No more than 15 KB
   - ඔබගේ මුහුණ පැහැදිලිව පෙනීම අනිවාර්ය වන අතර, ඡායාරූපය සඳහා බෝඩර් සහ අකුරු ආදිය ඇතුළත් නොකළ යුතුය.
   - ශරීරය සෘජුව තබා ඡායාරූපය ලබා ගත යුතුය.
   - ඇස් කණ්ණාඩි නොපැළඳ ඡායාරූපය ලබාගත යුතුය.








**වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට ප්‍රථම වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවයක් නොමැති බවට තහවුරුවක් ලබාගැනීම ඔබගේ වගකීමක් වේ. ( වර්ණ අන්ධතාවය පරීක්ෂා කර ලබාගත් වාර්තාව විභාග අයදුම් කිරීමේදී Upload නොකළ යුතුය.)**

**ඔබ විභාගය සමත්වීමෙන් පසුව කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි වීමට පෙර සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේදී නැවතත් වර්ණ අන්ධතාවය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර, එම අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය ඇති බවට තහවුරු වුවහොත් ඔබගේ විභාග ප්‍රතිඵල අවලංගු වනු ඇත.**

## 3. විභාග අයදුම්පත් ගාස්තුව - ඇමරිකානු ඩොලර් 28 ට සමාන රුපියල් අගය (රු.8428.48)

අයදුම්පත් ගාස්තුව ගෙවීමේදී ඔබට ආසන්නතම ජාතික ඉතිරිකිරිමේ බැංකුව, ලංකා බැංකුව හෝ මහජන බැංකුවෙහි පහත සඳහන් ගිණුම් වලින් එක් ගිණුමක් වෙත පමණක් මුදල් බැර කිරිම සිදුකළ යුතුය.


- 100-800-44-2461 - ජාතික ඉතිරි කිරීමේ බැංකුව (බත්තරමුල්ල ශාඛාව )
- 0000001650 - ලංකා බැංකුව ( ආයතනික ශාඛාව )
- 208100151791068 - මහජන බැංකුව ( බත්තරමුල්ල ශාඛාව )

විභාග ප්‍රවේශපත්‍රය ලබාගැනීම සඳහා මුදල් ගෙවු රිසිට්පත උඩුගත කිරීම ( Upload ) අනිවාර්යය බැවින්, **2025 සැප්තැම්බර් 11,12,15,16 සහ 17** යන දිනයන් වලදී **අනිවාර්යෙන්ම** මුදල් ගෙවීම සිදු කරන්න.

මුදල් ගෙවු රිසිට්පත ස්කෑන් කර ( **File Size: 1MB** ) තබාගැනීමට **කටයුතු කළ යුතුය. Online/ATM භාවිතයෙන් ගෙවීම් සිදු නොකල යුතුය.**

බැංකු රිසිට්පත සම්පුර්ණ කිරිමේදී **අනිවාර්යෙන්ම ඔබගේ නම, ලිපිනය, ගමන් බලපත්‍ර අංකය, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, මුදල් ගෙවන හේතුව ලෙස EPS-TOPIK -2025** විභාග අයදුම්පත් ගාස්තු ලෙස සඳහන් කල යුතු අතර, ඔබගේ ගමන් බලපත්‍රයේ සඳහන් අත්සන **පැහැදිලිව සටහන් කළ යුතුය.**එසේ නොවන **රිසිට්පත් ප්‍රතික්ෂේප** කරනු ලැබේ. **කිසිඳු තොරතුරක් සටහන් නොකර** මුදල් ගෙවීම් සිදු කරන බැංකු රිසිට්පත් ද **ප්‍රතික්ෂේප වේ.**

# බැංකු රිසිට්පත් පිරවිය යුතු ආදර්ශ ආකෘතිය



PEOPLE'S BANK
මහජන බැංකුව | மக்கள் வங்கி

තැන්පතු පත | வைப்புச்சீட்டு | Deposit Slip — Office Copy

ගිණුම් අංකය கணக்கு இலக்கம் Account Number: 208100151791068

දිනය | திகதி | Date: 09 2025

ගිණුම් හිමියාගේ නම / கணக்குரிமையாளரின் பெயர் / Name of Account Holder: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

Name: නම සඳහන් කරන්න

Address: ලිපිනය

Tel No: දුරකථන අංකය

NIC/P.P/D.L No.: ගමන් බලපත්‍ර අංකය

Purpose: EPS-TOPIK-2025 විභාග අයදුම්පත් ගාස්තු


Cash Depositor's Signature: ගමන් බලපත්‍රයේ අත්සන

| | Rs. | Cts. |
|---|---|---|
| x 5000 | | |
| x 2000 | | |
| x 1000 | | |
| x 500 | | |
| x 200 | | |
| x 100 | | |
| x 50 | | |
| x 20 | | |
| x 10 | | |
| Coins | | |
| Total | 8428 | 48 |

Valid if Overprinted or Signed by an Officer

Do Not Write Anything Below This Line

Checked by



NSB National Savings Bank

මුදල් තැන්පතු පත්‍රිකාව/பண வைப்புச் சீட்டு/Cash Deposit Slip

දිනය/திகதி/Date: 09 2025

Names of Account Holder/s/Card Holder/s: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

Account No. / Reference No.: 100-800-44-24610

Savings/FD | Credit Card Payment | Utility Bill Payment | Pawning | Loan | Other

Name of the Bank (For Credit Cards Only) | Utility Bill Type

Amount in Words: Rs. අට දහස් හාරසිය විසි අටයි සත හතළිස් අටක් පමණි.

Amount in Figures: Rs. 8428.48

Give the following information for cash deposits above LKR 200,000/- deposited by a person other than the account holder/card holder

Name: නම

Address: ලිපිනය

NIC/P.P/D.L. No.: ගමන් බලපත්‍ර අංකය සඳහන් කරන්න

Source of Funds or Purpose of the Deposit: EPS-TOPIK-2025 විභාග අයදුම්පත් ගාස්තු

Tel. No: දුරකථන අංකය / REF No.

For office use only.


| | Value Rs. | Cts. |
|---|---|---|
| x 5000 | | |
| x 2000 | | |
| x 1000 | | |
| x 500 | | |
| x 100 | | |
| x 50 | | |
| x 20 | | |
| x 10 | | |
| Coins | | |
| Total | 8428 | 48 |

ගමන් බලපත්‍රයේ අත්සන යොදන්න

Depositor's Signature

Valid if Overprinted or Signed by an Officer

Teller.



BANK OF CEYLON — BOC — Bankers to the Nation

මුදල් තැන්පතු පත්‍රිකාව பண வைப்புச் சீட்டு Cash Deposit Slip

දිනය / திகதி / Date: 09 2025

Account/Card Number: 0000001650

Account/Card Holder's Name and Address: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

Depositor's Name and Address: තැන්පත්කරුගේ නම පැහැදිලිව සඳහන් කරන්න.

N.I.C / P.P / D.L No.: ගමන් බලපත්‍ර අංකය

Telephone No: දුරකථන අංකය

Purpose of Deposit: EPS-TOPIK-2025 විභාග අයදුම්පත් ගාස්තු

Ref No.

Depositor's Signature: ගමන් බලපත්‍රයේ අත්සන

| Notes | Rs. | Cts. |
|---|---|---|
| 5000/- | | |
| 2000/- | | |
| 1000/- | | |
| 500/- | | |
| 200/- | | |
| 100/- | | |
| 50/- | | |
| 20/- | | |
| 10/- | | |
| Coins | | |
| Total | 8428 | 48 |

Valid Computer Print or Authorised Signature

Validation checked


Signature

## විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරිම සඳහා උපදෙස්:-

- **පියවර 1:-**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය (www.slbfe.lk ) වෙත පිවිස **Registration for Point System Examination -2025 ( Manufacturing, Fishery )** වෙත පිවිස ඔබගේ තොරතුරු ඇතුළත් කළ යුතුය.


ඒ සඳහා පහත රූප සටහනේ දක්වා ඇති සියළුම තොරතුරු වලට අදාලව සියළුම එකගතා **Click** කරන්න. (විභාග අයදුම්පතක් ලබාගැනීම සඳහා මෙහි සඳහන් සියළුම කරුණු / එකගතා Click කිරීම අනිවාර්යය වේ )




.

සියළුම කරුණු /එකගතා **Click** කිරිමෙන් අනතුරුව **ඉදිරියට යන්න / Next** බටනය **Click** කරන්න.

- **පියවර 2:-**ඉදිරියට ගිය පසු පහත රූප සටහනේ දක්වා ඇති පරිදි **ජාතික හැදුනුම්පත් අංකය** ඇතුලත් කරන්න.





ඉන් අනතුරුව **ඉදිරියට යන්න / Next** බටනය **Click** කරන්න.

**පියවර 3:-** පහත රූප සටහනේ දක්වා ඇති පරිදි,

* ඔබගේ ජාතික හැඳුනුම්පතේ **ඉදිරි-පස හා පිටුපස ඡායාරූපයන්** ඇතුලත් කරන්න.
* Personal Details යටතේ

I. ගමන් බලපත්‍රයේ Barcode හි සඳහන් පරිදි නම
II. ගමන් බලපත්‍ර අංකය
III. ස්ත්‍රී පුරුෂ භාවය
IV. උපන් දිනය (1985 සැප්තැම්බර් 15 සිට 2007 සැප්තැම්බර් 14 දක්වා උපන් අයෙකුවීම )
V. ජංගම දුරකථන අංකය ( මෙය පසුව වෙනස් කළ නොහැක )
VI. ලිපිනය
VII. විද්‍යුත් ලිපිනය
VIII. ලගම ඥාතියෙකුගේ දුරකථන අංකය
IX. නගරය
X. සමීපතම විදේශ සේවා නියුක්ති කාර්යාංශ මධ්‍යස්ථානය


**යන තොරතුරු ඇතුලත් කරන්න.**




උදාහරණයක් ලෙස පහත සඳහන් රූපයේ දක්වා ඇති පරිදි ඔබගේ නම ඇතුලත් කිරීමේදී ඉංග්‍රීසි කැපිටල් අකුරු භාවිතා කර ගමන් බලපත්‍රයෙහි Barcode/MRZ හි සඳහන් ආකාරයට ඇතුළත් කළ යුතුය.

**සැලකිය යුතුය-**

***ඔබගේ නම ඇතුළත් කිරිමේදී එක් එක් නමක් අවසානයේ එක් හිස්තැනක් පමණක් තබමින් නම ඇතුළත් කළයුතු අතර Barcode/ MRZ හි සඳහන් ආකාරයටම එක් අකුරක් හෝ වෙනස් නොවන පරිදි ඇතුළත් කිරීම අනිවාර්ය වේ.(එසේ නොවන අයදුම්පත් අනුමත වීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.)**



ඉහත සියළු තොරතුරු සම්පූර්ණ කිරීමෙන් පසුව **(Next )button (click )** කර ඉදිරියට යන්න.

- **පියවර 4:- එවිට ඔබට පහත සඳහන් තොරතුරු ඇතුළත් කළ හැකිය.**

ඔබගේ ඡායාරූපය සහ ගමන් බලපත්‍රයේ ඡායාරූපය ඇතුළත් පිටුවෙහි පැහැදිලි ස්කෑන් පිටපත් උඩුගත ( Upload) කරන්න .


**සැලකිය යුතුයි- ඔබගේ ගමන් බලපත්‍ර පිටපත ස්කෑන් කිරීමේදී Barcode/MRZ කැපී නොයන පරිදි සම්පූර්ණ පිටුවෙහි පිටපතක් ස්කෑන් විය යුතුය. එසේ නොවන අවස්ථාවන්හිදී ඔබගේ විභාග අයදුම් කිරීම අනුමත නොවනු ඇත.**

නිවැරදි




වැරදි




ඉහත සඳහන් රූප සටහනේ දක්වා ඇති පරිදි අයදුම්කරුගේ ඡායාරූපය, විදේශ ගමන් බලපත්‍ර යේ ඡායාරූපය සහිත පිටුවේ පැහැදිලි ස්කෑන් පිටපතක් උඩුගත **( Upload )** කරන්න.

එසේම ගමන් බලපත්‍රය නිකුත් කළ දිනය, ගමන් බලපත්‍රය අවලංගු වන දිනය හා අදාල රැකියා කාණ්ඩය ඇතුලත් කරන්න.

ඔබගේ ගමන් බලපත්‍රය නිකුත් කළ දිනය සහ අවලංගු වන දිනය **( වසර/මාසය/දිනය )** වශයෙන් ඇතුළත් කරන්න.


අනතුරුව ඉදිරියට යන්න / **Next** බටනය **Click** කරන්න.

**පියවර 5 :-**

පහත සඳහන් කර තිබෙන රූප සටහනේ දක්වා ඇති පරිදි සම්පූර්ණ කරන ලද සියළු තොරතුරු සත්‍ය සහ නිවැරදි බවත්, කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය වෙතින් විසින් දන්වා ඇති නීති රීති වලට එකඟ බව ආදි තොරතුරු සඳහන් කර, අයදුම්පත්‍ර ලබාගැනීම වෙනුවෙන් **ඔබ විසින් මුදල් ගෙවීම් කරන ලද දිනය, අදාල මුදල් ගෙවීම් සිදුකරන ලද** බැංකුව සඳහන් කර ඔබගේ **ජංගම දුරකථනය වෙත ලැබුණු සත්‍යාපන කේතය ( OTP / Verification Code )** නියමිත පරිදි ඇතුලත් කරන්න.


**අනතුරුව ඔබගේ අයදුම්පත අප වෙත Apply බොත්තම ක්ලික් කර යොමු කරන්න.**

**මුදල් ගෙවීම් සිදුකරන ලද දිනය ඇතුලත් කරන්න**




අයදුම්පත පරීක්ෂා කිරීමෙන් පසුව ඔබගේ අයදුම්පත්‍රය අප වෙත ලැබුණු බවට ඔබට කෙටි පණිවුඩයක් මඟින් දැනුම් දෙන අතර, අයදුම්පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔබගේ අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි නම්, කෙටි පණිවිඩයක් මඟින් ඔබට හිමි විභාග අංකය දැනුම් දෙනු ඇත.

ඒ අනුව ඔබ වෙත ලැබෙන විභාග අංකය භාවිතා කර කාර්යාංශය දැනුම් දුන් පසු අයදුම්පත බාගත කර ගැනීමට කටයුතු කළ යුතුය.




ඔබ විසින් ඇතුළත් කළ තොරතුරු වල යම් දෝෂයක් පවතී නම් එම අයදුම්පත් අනුමත නොවනු ඇත. එසේ අනුමත නොකිරීමට හේතුව සඳහන් කර එය නිවැරදි කරන ලෙස අප විසින් ඔබ වෙත කෙටි පණිවුඩයක් එවනු ඇත. එම කෙටි පණිවුඩයේ සඳහන් පරිදි නිවැරදි කර අයදුම්පත නැවත යොමු කළ යුතුය.

**සියළුම අයදුම්කරුවන් ඉහත උපදෙස් අනුගමනය කරමින් විභාගය සඳහා ලියාපදිංචි වීමට කාරුණික වන්න.**

**පෞද්ගලික තොරතුරු රැස්කිරීම සහ භාවිතය පිළිබඳව කැමැත්ත විමසීම**

| | |
|---|---|
| **අරමුණ** | රැකියා බලපත් ක්‍රමයට අදාලව අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම, රැකියා සොයන්නන්ගේ ලැයිස්තුවේ ලියාපදිංචි කිරීම සඳහා පුද්ගලික තොරතුරු රැස්කිරීම කරනු ලැබේ. |
| **ලබාගන්නා ලද තොරතුරු** | ඡායාරූපය, නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, ගමන් බලපත්‍ර අංකය, දුරකථන අංකය ඇතුළු සම්බන්ධතා තොරතුරු, අයදුම්පත් අකය |
| **රඳවාගැනීමේ කාලසීමාව** | EPS TOPIK සහ ඒ ආශ්‍රිත පරිපාලන ක්‍රියාවලිය ( අර්ධ ස්ථිර ) අවසන් වන තුරු |
| **අයදුම්කරුවන්ගේ අයිතිවාසිකම්** | පුද්ගලික තොරතුරු රැස්කිරීම සහ භාවිතය සඳහා කැමැත්ත ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇත. කෙසේ වෙතත්, ප්‍රතික්ෂේප කිරීමට අදාල පරික්ෂණය සඳහා අයදුම් කිරීමේදී එහි සීමාවන් හෝ අවාසි සහගත තත්ත්වයන් ඇති කරයි |

**තෙවන පාර්ශවයක් වෙත පෞද්ගලික තොරතුරු ලබාදීම.**

රැකියා බලපත්‍ර ක්‍රමයට අදාලව, කොරියානු භාෂා පරික්ෂණය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීම යනු විදේශිය සේවකයින්ගේ රැකියා පිළිබඳ පනතේ 07 වන වගන්තියේ සහ බලාත්මක කිරීමේ නියෝගයේ 13 සහ 31-2 වගන්ති මත පදනම්ව පරික්ෂණය පරිපාලනය කිරීම සහ රැකියා සොයන්නන්ගේ දත්ත ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය පෞද්ගලික තොරතුරු රැස්කර පහත සඳහන් ආයතන විසින් සකස් කර, භාවිතා කළ හැකි බවයි. මෙහි සඳහන් විධිවිධාන සඳහා කැමැත්ත ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇත. කෙසේ වෙතත් ඔබ එකග නොවන්නේ නම්, ඔබට EPS-TOPIK අයදුම් කිරීමට නොහැකි වනු ඇත.

| ආයතනය | සපයන ලද තොරතුරු | රඳවාගැනීමේ කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| කොරියානු රැකියා තොරතුරු සේවාව | ඡායාරූපය, නම, උපන් දිනය, ස්ත්‍රී-පුරුෂ භාවය, ගමන් බලපත්‍ර අංකය, දුරකථන අංකය, අයදුම්පත් අංකය | අර්ධ කාලීන / ස්ථිර | අයදුම්කරුන්ගේ ලැයිස්තුව ලියාපදිංචි කිරීම සහ රැකියා බලපත්‍ර සහ කම්කරු කොන්ත්‍රාත් ක්‍රියා පටිපාටි වැනි පරිපාලන කාර්යයන් හැසිරවීම |
| එරට තානාපති කාර්යාලය ( දකුණු කොරියාව ) සහ මෙරට කොරියානු තානාපති කාර්යාලය ( ශ්‍රී ලංකාව ) | | | නියමිත රට අනුව යොමුකිරීමේ සහ හඳුන්වාදීමේ තත්ත්වය නිරික්ෂණය කිරීම හා නීති විරෝධීව රැදී සිටීම වැනි කාර්යයන් වෙනුවෙන් අදාල පරිපාලනමය ක්‍රියාමාර්ග ලබාගැනීම |
| ආගමන විගමන කාර්යාලය | | | CCVI නිකුත් කිරීම සඳහා අයදුම්කිරීම වැනි කාර්යයන් සකස් කිරීම |

**නිවැරදිම හඳුනාගැනීමට අදාල තොරතුරු සකස් කිරීම**

| අදාල තොරතුරු | රඳවාගැනීමේ කාලසීමාව | අරමුණ | අයදුම්කරුවන්ගේ අයිතිවාසිකම් |
|---|---|---|---|
| ගමන් බලපත්‍ර අංකය | අර්ධ කාලීන | EPS –TOPIK පැවැත්වීම සහ අදාල නීතිවලට අදාල වන අයදුම්කරුවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම වෙනුවෙන් අදාල හඳුනාගැනීමේ තොරතුරු රැස්කිරීම සහ සැකසීම | අනන්‍යතාවය හඳුනාගැනීමේ තොරතුරු ප්‍රතික්ෂේප කිරීම සඳහා අයදුම්කරුට අයිතියක් ඇත. කෙසේ වෙතත්, අදාල තොරතුරු ලබාදීමට ඔවුන් අපොහොසත් වුවහොත් පරීක්ෂණයට අදාල අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය. |

**පෞද්ගලික තොරතුරු හැසිරවීම පිලිබඳව මාර්ගෝපදේශනය**

EPS-TOPIK අයදුම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා කම්කරු සහ සේවා අමාත්‍යාංශය වෙතින් පෞද්ගලික තොරතුරු මත පදනම් වූ සේවාවන්ට අදාල අවබෝධතා ගිවිසුමක් සහ සේවා සංස්ථාපිත ගිවිසුමක් සකස් කරනු ඇත.

| ආයතනය | ලබාදී ඇති තොරතුරු | රඳවාගැනීමේ කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| EPS-යොමුකිරීමේ නියෝජිත | ඡායාරූපය, නම, උපන් දිනය,ස්ත්‍රී -පුරුෂ භාවය, ගමන් බලපත්‍ර අංකය, දුරකථන අංකය, අයදුම්පත් අංකය | නියමිත EPS-TOPIK විභාගයට අදාල විභාග අයදුම්පත් නිකුත් කිරීමේ කාලසීමාව ඇතුලත | EPS-TOPIK අයදුම්පත වෙනුවෙන් නියමිත අනන්‍යතාවය තහවුරු කර ගැනීම සහ අදාල කාර්යයන් |